


අල්ලපු ගෙදර නංගිල එදා හදිස්සියෙම අපේ ගෙදරට ගොඩ වැදිල තේ බිබී කතා කරකර ඉඳල ආපසු ගිහින් සති දෙක තුනක් ගත වුන නිසා මට නිකමට වගේ හිතුන කෝල් එකක් දීල බලන්න. ඉස්සර එක ලඟ ෆ්ලැට්ස් දෙකක හිටපු නිසා පරණ පුරුද්දට අල්ලපු ගෙදර නංගි කියල කිව්වට දන්නවනෙ, ශ්‍රීපාලිලයි අපියි දැන් ඉන්නෙ කිලෝ මීටර් තිහකටත් වැඩිය දුරින් පලාත් දෙකක.

''හොඳ වෙලාවට අක්ක කතා කළේ. මම මේ දැන් ඇත්තටම සිරි එක්ක කිය කිය හිටියෙ අද හවසට වත් අල්ලපු ගෙදර අක්කට කතා කරන්න ඕනැ කියලයි පොඩි කාරණයක් ගැන" ශ්‍රීපාලි කිව්ව. සිරි කියන්නෙ ශ්‍රීපාලිගෙ මහත්තය.
''ඇයි නංගි මොකක්ද කාරණේ?" මං ඇහැව්වෙ කෙල්ල පෝෂණවේදී උපාධිය හමාර කරල පාටියක් වත් දන්න යනවද මන්ද කියල හිතමින්.

''වෙන මොකුත් නෙමෙයි අක්කෙ, මට හිතුනා මේ වෙසක් පෝයට සිල් ගන්න ලංකාරාමෙ. අක්කත් එනවද අහන්නයි කෝල් කරන්න හිටියෙ."
''සාදු, සාදු!" මට ඉබේම කියවුනා. ''අනේ හොඳයි නංගී, ඒක නම් ලොකු දෙයක්."

''ඔව් අක්කෙ මේ විභාග වලටයි, ගෙදර වැඩ වලටයි පැටලිලා ඉන්න කොට දවස් සති මාස වෙලා ඉගිලිලා යනව මිසක් කවදාකවත් හිතට නිදහසක් නෑ. මේ ස්ට්‍රෙස් එකෙන් දවසකට වත් අයින් වෙලා හිත සන්සුන් කරගන්න තමයි මට සිල් ගන්න හිතුනෙ."

''ඒක ඇත්ත, භාවනාව හැම දේටම හොඳයි කියල කවුරුත් කියනවනෙ. හැබැයි නංගි එතකොට පොඩි එවුන් දෙන්නා?" මම ශ්‍රීපාලි ට ගිහි ගෙයි බැම් මොහොතකට මතක් කරල දුන්නා.
''ඒ දෙන්නත් වෙසක් පෝයදා සිල් වැඩ සටහනට යවන්නයි ඉන්නෙ අක්කෙ. අපේ සිංහල ඉස්කෝලෙ තියෙන දහම් පාසැලේ ළමයි හැමෝම වගෙ සිල් ගන්නව එදාට. හැබැයි පොඩ්ඩන්ගෙ සිල් නම් දවල් එකට ඉවරයි. එතැන ඉඳන් ළමයින්ව බලාගන්නම් කියල සිරි පොරොන්දු වුනා."

''කොච්චර හොඳද නංගී?" මං කිව්වෙ හරිම සන්තෝසෙන්.
''ඉතිං අක්කත් එනවද කියන්නකෝ?"
''අනේ නංගි, මට නම් සිල් අරගෙන පුරුද්දක් නැහැ. නිකං මොකක්ද වගෙ. පවට පිණ දෙන්න බැහැයි කියනවනෙ? පිං කරන්න අවස්ථාවක් ලැබෙන්නත් පින් කරල තියෙන්න ඕනැ!"

''මොනව? අක්ක කවදාවත්ම සිල් අරගෙන නැද්ද?"
''එකම එක දවසක් ගත්ත නංගි, මං පහේ පන්තියෙ ඉන්න කාලෙ. ඒකත් හරි හිනා යන කතාව."
''අනේ අක්කෙ, කියන්නකො!" ශ්‍රීපාලි කවදත් හරි කැමතියි මගෙ පරණ කතා අහන්න.

''ඔන්න නංගී, අපේ ප්‍රාථමිකයෙන් ළමයින් ට සීල ව්‍යාපාරයක් ලැහැත්ති කලා ඒ අවුරුද්දෙ පොසොන් පෝයට. ගෙදරින් කැමැත්ත ඇතිව මමත් සහභාගී වුනා. හැබැයි අම්මයි තාත්තයි කිව්ව දවල්ට පන්සලේ දනෙ කන්න ඉන්නෙ නැතුව ගෙදර එන්නයි කියල. මමත් සිල් රෙද්ද පිටින්ම දවල් ගෙදර ගිහින් බලන කොට එදා අපේ පුංචි අම්මල ඇවිල්ල නිවාඩු දවස නිසා අපිව බලන්න. ඉස්සර ඉතිං ටෙලිෆෝන් තිබුනයැ කලින් දන්වන්න එන බව. අද හිතුන, හෙට ගියා. ඉතිං මමත් නෑයො එක්ක හොඳට කාල බීල සෙල්ලම් කර කර හිටිය මිසක් ආපසු එදා පන්සලට ගියේ ම නෑ. මගේ සිල් ගැනීම එතැනින්ම ඉවර උනා!"

''එහෙනම් අක්ක අදත් එදා සිල් ගත්තු ගමන්මයි අදත් ඉන්නෙ! සිල් පවාරණය කළේ නැහැනෙ තවම?" අල්ලපු ගෙදර නංගි හිනාව අතරින්ම කිව්ව.
''ඇත්තටම නංගී, මේ දවස්වල විකාල භෝජනේකුත් නැති නිසා අටසිල් ගත්ත වගේ තමයි. මං මේ දවස්වල රෑට සුප් එකක් බොනව විතරයි. බර කෑම ගන්නෙ නෑ දැන් කාලයක ඉඳල."
''අක්ක හිතුවෙ සුප් ටික බොනව මිසක් විකල කන්නෙ නැති හින්ද ඒක විකාල භෝජනයක් නෙමේ කියලද?" ශ්‍රීපාලි ගෙ හිනාව නැවතිල්ලක් නෑ තවමත්.

''හැබැයි නංගි, මං මෙහෙම වුනාට, මගේ අම්ම නම් දැන් අවුරුදු දහයක විතර ඉඳල හැම පෝයටම සිල් ගන්නව මහරගම ධර්මායතනේ."

''ආනේ, ඇත්තද අක්කෙ? ඒත් මහරගම ටිකක් දුරයි නේද අක්කලගෙ මහ ගෙදර ඉඳල? ඒ අවටත් පන්සල් දෙකක් ම තියෙනව නේද?"

''ඒ ගමේ ගොඩේ පන්සල් වගෙද නංගී ධර්මායතනෙ? ගන්නවත් වෙලා හොඳ පන්සලක එපායැ සිල් ගන්න." ආයෙත් හිනාව දෙගොඩ තලා ගියා.
''ඒක නෙමෙයි නංගි, මං දැන් හිතාගත්තා සිල් ගත්තත් නොගත්තත් එදාට පන්සල ට එනව කියල උදෙන්ම නොවරදවා නිමලුත් එක්ක."

''ඇයි අක්කෙ, ඒ?"

''ඇයි ළමයො, කවුරු හරි ඕනැනෙ ඔයාට කිරිපිඩු දනෙයි, කුස තණ මිටි අටකුයි ගේන්න!!!" නංගියෙ හැබැයි, සිල් ගත්තහම නම් සන්සුන්ව ඉන්න වෙයි, මේ වගෙ කැකිරි පලන්න නම් බෑ ඔන්න!

**අල්ලපු ගෙදර අක්කා විසිනි.**

ඊලඟ සතියේ: සිංහල සීල බාවනා, ඉංගිරිසි කතා බහ.

ඔබේ අදහස් දන්වන්න
allapugedara@gmail.com

ප්‍රමිතා රෝහිණී ගෙන්

## හිරට මුවාවෙන්




2007 වසරේ ලංකාවේදී මුද්‍රණයෙන් එළිදක්වන ලද 'හිරට මුවාවෙන්' නම්වූ පොත, කැන්බරා පදිංචිව සිටින ප්‍රමිතා රෝහිණී මහත්මියගේ ප්‍රථම නිර්මාණ එකතුවයි.

නවතම ආරක් ලෙසට කවි 62 ක් සහ කෙටි කතා 10 කින් යුක්තව ප්‍රකාශයට පත්කර ඇති ඇගේ පොත අගයකරමින් ඊට පෙරවදන සපයන සුප්‍රසිද්ධ ලේඛක දොස්තර ගුණදාස අමරසේකර මහතා මෙසේ පවසයි: ''මේ කෙටිකතා එකතුව එතුමිය සාහිත්‍යකරණය සඳහා අවශ්‍ය වාසනා ගුණය ඇති තැනැත්තියක බව නොමදව හෙළි කරයි. ඒ වාසනා ගුණය මල්ඵල ගැන්වෙනු ඇත්තේ විචාරශීලී මනසින් යුතුව, සරු දෙය නිසරු දෙයින් වෙන්කර ගනිමින් ජීවිත පරිශුද්ධානයෙන් යුතුව සාහිත්‍යකරණයෙහි යෙදීමෙන් පමණි. එය එතුමිය අතින් ඉටුවෙනු දැක්ම අපේ ප්‍රාර්ථනාවයි''.

එම ප්‍රාර්ථනයට අපිද එකතු වෙමු.

**විද්‍යානි මනතුංග**





